# අභයන්තර විගණන දෙපාර්තමේන්තුව

# 2016 වර්ෂ අවසාන අභ්‍යන්තර විගණන ප්‍රගති සමාලෝචන සාකච්ඡාව

2016 වර්ෂය තුළ අභ්‍යන්තර විගණන කටයුතු සම්බන්ධයෙන් සලකා බැලීමේදී සාර්ථක අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට හැකියාව ලැබුණි.

මේ සඳහා ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ, ඌව පළාත් ප්‍රධාන ලේකම්තුමන්ගේ මග පෙන්වීම් ඉතා වැදගත් වූ බව පෙන්වා දෙමි.

එසේම අභ්‍යන්තර විගණන කටයුතු වලදී සියලුම ලේකම්වරුන් හා ලේකම්වරියන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ගණකාධිකාරිවරුන් සහ කාර්ය මණ්ඩලය මඟින් ප්‍රමාණවත් සහයක් ලබා දුනි. මෙහිදී රාජ්‍ය විගණනයේ සහයද අභ්‍යන්තර විගණන කටයුතු සඳහා ලැබුණු අතර නිරන්තරයෙන් විගණන හා කළමනාකරණ කමිටු වල ක්‍රියාකාරිත්වයද මේ සඳහා බලපානු ලැබීය.

**2016 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුවේ පැරණි නිලධාරීන් ස්ථාන මාරු වී යාම නිසා මාස 07 ක පමණ කාල සීමාවක් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමට හැකියාවක් නොලැබුණි. නමුත් ගරු ආණ්ඩුකාරතුමාගේ හා ඌව පළාත් ප්‍රධාන ලේකම්තුමාගේ මැදිහත් වීම මත නිලධාරීන් කීප දෙනෙකු දෙපාර්තමේන්තුව වෙත අනුයුක්ත කල අතර මේ වන විටද ඔවුන් විගණන පුහුණු කටයුතු වල නිරතව සිටී.**

**2016 වර්ෂය තුළදී අභ්‍යන්තර විගණන පරීක්ෂණ 300 ක් ඉලක්ක ගත කර තිබුණද නිම කිරීමට හැකියාව ලැබුණේ විගණන පරීක්ෂණ 205 ක් හා විශේෂ විමර්ශන 46 ක ප්‍රමාණයකි. ඒ අනුව සමස්ථ විගණන හා විශේෂ පරීක්ෂණ 251 ක් සිදු කරන ලද අතර වාර්තා 190 ක් නිකුත් කිරීමට හැකියාව ලැබුණි. ඒ අනුව අමාත්‍යාංශ මට්ටමින් සිදු කල විගණන වාර්තා සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ.**

# 01. කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන, මිරිදිය ධීවර කර්මාන්ත, ප්‍රවාහන හා සංචාරක කටයුතු අමාත්‍යාංශය

| සිදු කළ පරීක්ෂණ සංඛ්‍යාව | 15 |
| --- | --- |
| විගණන පරීක්ෂණ වලින් පසු නිකුත් කළ විගණන විමසුම් සංඛ්‍යාව | 08 |
| පිළිතුරු ලැබූ සංඛ්‍යාව | 05 |
| පිළිතුරු අනුව පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කිරීම නිසා එකඟතාවය ලබා දුන් ප්‍රමාණය | 03 |
| පිළිතුරු ලැබිය යුතු සංඛ්‍යාව | 03 |

# කෘෂිකර්ම අමාත්‍යාංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව යටතේ තවදුරටත් අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රයන්

1. **2016 වර්ෂයේ වෙන්වූ ප්‍රතිපාදන**

**i. කෘෂිකාර්මික කටයුතු සංවර්ධනය - රු. 162,000,000.00**

**ii. ගොවිපළ සංවර්ධනය - රු. 40,000,000.00**

ඉහත ප්‍රතිපාදන උපයෝගී කර ගෙන ජාතික මට්ටමේ ප්‍රතිපත්ති වලට සමගාමීව කටයුතු සිදු වී ඇත. පහත ක්ෂේත්‍රයන්හි කටයුතු පිළිබඳ විශේෂ අවධානය තවදුරටත් යොමු විය යුතුය.

කෘෂිකර්ම ක්ෂේත්‍රය තුළ විගණන පරීක්ෂණ හැකිතාක් කෘෂි උපදේශක කාර්යාල වල සහ අදාළ ක්ෂේත්‍රයන්ට සම්බන්ධව සිදු කරන ලදී.

## I. <u>කෘෂි භෝග වගාවේදී මතුවන රෝගී තත්ත්වයන්</u>

උදා :-

- මිරිස් කොළ කොඩ වීමේ රෝගය (තණමල්විල කෘෂි උපදේශක කොට්ඨාසය)



- පොල් කුරුම්ණි උවදුර (තණමල්විල කෘෂි උපදේශක කොට්ඨාසය)



- පොල් කුරුමිණී උවදුර සහ පොල් ගස මල කැම (ගිරාදුරුකෝට්ටේ කෘෂි උපදේශක කොට්ඨාසය)




22 12 2016

- බෝංචි වගාවේ කොල අංගමාරය (ලුණුගල කෘෂි උපදේශක කොට්ඨාසය)



# II. කාබනික පොහොර භාවිතය

- **50%** ක ගොවි දායකත්වය යටතේ මෙම ව්‍යාපෘති සඳහා දෙපාර්තමේන්තු මට්ටමේ අනුග්‍රහයද ලබා දී තිබුණි. ක්ෂේත්‍රයේ සියලුම ගොවීන් මේ සඳහා දායක කර ගැනීමට නිශ්චිත වැඩ පිළිවෙලක් කෘෂි උපදේශනය තුළින් නිරීක්ෂණය නොවන අතර කාබනික පොහොර නිෂ්පාදනයට පමණක් සීමා වී ඇත. කාබනික පොහොර භාවිතයේ වැදගත්කම ගොවීන් අතර තවදුරටත් ප්‍රවර්ධනය කිරීමේ අවශ්‍යතාවය මතු වේ.

- තණමල්විල කෘෂි උපදේශක කොට්ඨාසය



- අසාර්ථක වූ කොම්පෝස්ට් ව්‍යාපෘති




22 12 2016

# 02. මාර්ග සංවර්ධන, නිවාස, ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය

| සිදු කළ පරීක්ෂණ සංඛ්‍යාව | 21 |
| --- | --- |
| විගණන පරීක්ෂණ වලින් පසු නිකුත් කළ විගණන විමසුම් සංඛ්‍යාව | 13 |
| පිළිතුරු ලැබූ සංඛ්‍යාව | 09 |
| පිළිතුරු අනුව පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කිරීම නිසා එකඟතාවය ලබා දුන් ප්‍රමාණය | 06 |
| පිළිතුරු ලැබිය යුතු සංඛ්‍යාව | 04 |

# තවදුරටත් මාර්ග දෙපාර්තමේන්තුව යටතේ පහත තත්ත්වයන් පිළිබඳ විශේෂ අවධානයක් යොමු විය යුතුය.

i. <u>මාර්ග දෙපස සිදුවන කැණීම් කටයුතු සම්බන්ධව (ජල සම්පාදනය)</u>

නිරන්තරයෙන් පළාතේ මාර්ග වල නිසි ක්ෂේත්‍ර අධීක්ෂණයක් සිදු නොවන තත්ත්වයක් යටතේ වෙනත් ආයතන මඟින් සිදු කරන මාර්ග දෙපස කැණීම් කටයුතු වලදී මාර්ගයන්ට හානි පැමිණුන අවස්ථා විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

- බණ්ඩාරවෙල - අඹදණ්ඩේගම මාර්ගයේ ජලනල එළීමට කාණු කැපීම මත මාර්ගයට හානි සිදුවී ඇති අයුරු









- බණ්ඩාරවෙල - හීල්ඔය මාර්ගයේ ජලනල එලා මාර්ගය යථා පරිදි සකස් නොකිරීම නිසා මාර්ගයට හානි සිදුවී ඇති අයුරු







## II. මාර්ග නඩත්තු කටයුතු සම්බන්ධව

- නඩත්තු කටයුතු ඉටු කිරීමේදී නියමිත අවස්ථාවේ සිදු කල යුතු කාර්යය සිදු නොවීම මත මාර්ග සඳහා හානි පැමිණවී ඉදිරියේදී විශාල පිරිවැයක් දැරීමට සිදු වන අවස්ථාද නිරීක්ෂණය වේ.

- **හීල්ඔය - කුරුඳුගොල්ල මාර්ගය**



සුළු අලුත්වැඩියාවන් සිදුකළ යුතු ස්ථාන එසේ නොකර පවතින අයුරු



සුළු අලුත්වැඩියාවන් සිදුකළ යුතු ස්ථාන එසේ නොකර
පවතින අයුරු

මාර්ගයේ ජලය එක්රැස්වීම මත මාර්ගයට හා මාර්ගයේ
ආරක්ෂිත බැම්මට හානි සිදුවී ඇති අයුරු





මෙහිදී අනාවරණය වූ කරුණක් වන්නේ ක්ෂේත්‍ර මාර්ග කටයුතු අධීක්ෂණය සඳහා ප්‍රමාණවත් තාක්ෂණ නිලධාරීන්ගේ සේවාව ලබා ගැනීමේ අපහසුතාවයයි.

මෙහිදී වර්තමාන තාක්ෂණ නිලධාරීන් බඳවා ගැනීමේ ක්‍රමවේදය පෙර පැවති තාක්ෂණ නිලධාරීන් බඳවා ගැනීමේ ක්‍රමවේදය පිළිබඳ කරුණු සාකච්ඡා කර මෙම ගැටලුව විසඳා ගැනීම තුළින් මාර්ග වල සිදු කරන කර්මාන්ත හා නඩත්තු කටයුතු පිළිබඳව නිසි අධීක්ෂණයක් හා පරීක්ෂාවක් සිදු කල හැකි බව පෙන්වා දෙමි.

# 03. සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක, වනිතා කටයුතු අමාත්‍යාංශය

| සිදු කළ පරීක්ෂණ සංඛ්‍යාව | 31 |
|---|---|
| විගණන පරීක්ෂණ වලින් පසු නිකුත් කළ විගණන විමසුම් සංඛ්‍යාව | 22 |
| පිළිතුරු ලැබූ සංඛ්‍යාව | 15 |
| පිළිතුරු අනුව පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කිරීම නිසා එකඟතාවය ලබා දුන් ප්‍රමාණය | 09 |
| පිළිතුරු ලැබිය යුතු සංඛ්‍යාව | 07 |

# තවදුරටත් අවධානය යොමු කල යුතු සෞඛ්‍ය ක්ෂේත්‍රයට අදාළ විශේෂිත වූ කරුණු පහත පරිදි වේ.

## i. රෝහල් සඳහා උපකරණ සැපයීම

ඉහත කරුණ යටතේ රෝගී සත්කාරක සේවා සඳහා රෝහල් වලට සපයා ඇති වටිනා හා අත්‍යවශ්‍ය උපකරණ කිහිපයක් වගකීම් කාලයද නිම වී සහ නිම වීමට ආසන්න තත්ත්වයක් පැවතුණද විවිධ හේතූන් මත මේ වන තුරු ක්‍රියාත්මක භාවයද පත් කිරීමට කටයුතු සිදු කර නොමැත. මෙම තත්ත්වය මත රෝගීන් සඳහා අත්‍යවශ්‍ය පරීක්ෂාවන් සිදු කර ප්‍රතිකාර ගැනීමට නොහැකි වීම සහ යන්ත්‍රය භාවිතයෙන් තොර නිසා විනාශ වී යාමේ අවධානමක් නිරීක්ෂණය වේ. මේ පිළිබඳව කඩිනම් අවධානය යොමු විය යුතුය.

• උදා :-

තණමල්විල රෝහලේ වකුගඩු රෝගීන් හදුනා ගැනීම සඳහා භාවිතා කරන රු. 3,000,000.00 පමණ වටිනා BIO CHEMISTRY ANALYZER යන්ත්‍රය (ජීව රසායන විශ්ලේෂණ) ප්‍රයෝජනයට නොගෙන ගබඩා කර ඇත.




FRAGILE
ACCESSORIES BOX-R
FRAGILE
DO NOT TUMBLE

මෙම වෛද්‍ය උපකරණ වකුගඩු රෝගීන් හදුනා ගැනීම සඳහා අවශ්‍යකරණ වෛද්‍ය පරීක්ෂණ සඳහා යොදා ගන්නා අතර මෙම ප්‍රදේශයේ ජලයේ පවතින ආසාත්මිකතාවයන් වකුගඩු රෝගය බලපාන බැවින් මෙම වටිනා වෛද්‍ය උපකරණ තුළින් ඉතා විශාල සේවාවක් ඉටු කල හැකි නමුත් මෙම උපකරණ ප්‍රයෝජනයට නොගැනීම අයහපත් තත්ත්වයක් බව පෙන්වා දෙමි.

- බණ්ඩාරවෙල රෝහල




රුධිර පරීක්ෂණ යන්ත්‍ර




රුධිර පරීක්ෂණ යන්ත්‍ර






රුධිර පරීක්ෂණ යන්ත්‍ර

රු. 1,500,000.00 වටිනා වෛද්‍ය උපකරණ වායු සමීකරණය කරන ලද කාමර තුළ ප්‍රමිත ගත තත්ත්වයන් තුළ ස්ථාපිත කර ප්‍රයෝජනයට ගත යුතු වුවත් විවෘත පරිසරයක් තුළ මෙම උපකරණ තබා ප්‍රයෝජනයට ගන්නා බව නිරීක්ෂණය වේ. මේ තුළින් එම උපකරණ මඟින් ලබා දෙන දත්ත වෙනස්කම් වලට භාජනය වීමේ අවධානමක් පවතී. රුධිර පරීක්ෂණ වෙනත් රෝග පරීක්ෂණ සඳහා මෙම උපකරණ තුළින් ලබා දෙන දත්ත වෛද්‍යවරු ප්‍රයෝජනයට ගනී. එබැවින් ඉහත වෛද්‍ය උපකරණ ප්‍රමිත ගත තත්ත්වයන් තුළ ස්ථාපිත කල යුතු බව වෛද්‍යවරුන් ප්‍රකාශ කර සිටී.

## II. ඖෂධ ක්‍රියාවලිය

කල් ඉකුත් වූ සහ භාවිතයෙන් ඉවත් කර ඇති ඖෂධ වර්ගද රෝහල් ගබඩා තුළ තවදුරටත් පවතින බව නිරීක්ෂණය වේ. මෙම ඖෂධ රෝගීන්ගේ භාවිතයට ගැනීමේ ඉඩකඩ පවතින බැවින් මේ පිළිබඳ විශේෂ කඩිනම් අවධානය යොමු කල යුතුය.

- තණමල්විල, ඇකිරියන්කුඹුර

කල් ඉකුත් වූ ඖෂධ, ඖෂධ ගබඩා තුළම තබා ඇති ආකාරය නිරීක්ෂණය විය.



# III. දේශීය වෛද්‍ය අංශය

බිබිල, මැදගම සහ මිරිස්වත්ත ඖෂධ නිෂ්පාදනාගාර වල ප්‍රමාණවත් ගබඩා පහසුකම් සපුරා නොගැනීම මත වියලි ඖෂධ ගබඩාකරණයේදී ඖෂධ ආරක්ෂාව පිළිබඳව ප්‍රමාණවත් මට්ටමක් නිරීක්ෂණය නොවන බැවින් ඒ පිළිබඳ අවධානය යොමු කල යුතුය.









# 04. මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, සංස්කෘතික සමාජ සුභ සාධනය හා ග්‍රාමීය යටිතල පහසුකම් හා සංවර්ධන හා ඉදිකිරීම් අමාත්‍යාංශය

| සිදු කළ පරීක්ෂණ සංඛ්‍යාව | 138 |
|---|---|
| විගණන පරීක්ෂණ වලින් පසු නිකුත් කළ විගණන විමසුම් සංඛ්‍යාව | 117 |
| පිළිතුරු ලැබූ සංඛ්‍යාව | 98 |
| පිළිතුරු අනුව පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කිරීම නිසා එකඟතාවය ලබා දුන් ප්‍රමාණය | 62 |
| පිළිතුරු ලැබිය යුතු සංඛ්‍යාව | 19 |

# තවදුරටත් අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රයන්

i. අධ්‍යාපන ක්ෂේත්‍රය

- **සිසු පාදක සහ ගුරු පාදක පුහුණු වැඩසටහන් පැවැත්වීම.**

සැලකිය යුතු ප්‍රතිපාදනයක් වැය කර ඉහත වැඩසටහන් ක්‍රියාත්මක වන නමුත් එම වැඩසටහන් වල සාර්ථකත්වය මෙන්ම ඒ මගින් අධ්‍යාපන සංවර්ධනයේ ඇති වී තිබෙන ප්‍රගතිය පසු විපරම් කිරීමේ ක්‍රමවේදය තවදුරටත් ශක්තිමත් කල යුතුය. මේ තුළින් ඉදිරි වර්ෂ වල පුහුණු වැඩසටහන් වඩාත් සාර්ථකව ප්‍රතිඵල ලබා ගත හැකි පරිදි සැලසුම් කිරීමේ හැකියාව පවතී.

## II. පාසල් පරිසරය

බොහෝ පාසල් වල සිදු කරනු ලබන සංවර්ධන ව්‍යාපෘතීන් තුළින් ඉවත් කරන ද්‍රව්‍ය පාසල් පරිසරය තුළට අවිධිමත් ආකාරයෙන් රඳවා තැබීම නිසා පාසල් කටයුතු වලට මෙන්ම පාසල් පරිසරයට අයහපත් තත්ත්වයක් සිදු වී ඇත. මෙම තත්ත්වය සෘජුවම ළමුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා බලපා ඇති බව නිරීක්ෂණය වේ.

## i. හාලිඇල දෙමළ මහා විද්‍යාලය




தமிழ் வித்தியாலயம்,ஆலி-எல

# II. තල්දෙන ප්‍රාථමික විද්‍යාලය





# III. මො/ දොඩම්ගොල්ල මහ විද්‍යාලය




TOKYO SUPER
19 11 2016

# IV. මො/ තෙළුල්ල කණිෂ්ඨ විද්‍යාලය



III. පාසල් පරිසරය තුළ දක්නට ලැබෙන අනාරක්ෂිත සෞඛ්‍ය ගැටලු ඇතිවන ආකාරයේ ගොඩනැගිලි සහ ස්ථාන පැවතීම. ඒ පිළිබඳ විශේෂ අවධානයක් ඉදිරි වර්ෂය තුළ යෙදවිය යුතුය.

# III. තල්දෙන ප්‍රාථමික විද්‍යාලය



## i. හාලිඇල දෙමළ මහා විද්‍යාලය





# 05. ක්‍රීඩා හා යෞවන කටයුතු, විදුලි බල හා බලශක්ති, පේෂකර්ම හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය

| සිදු කළ පරීක්ෂණ සංඛ්‍යාව | 26 |
|---|---|
| විගණන පරීක්ෂණ වලින් පසු නිකුත් කළ විගණන විමසුම් සංඛ්‍යාව | 19 |
| පිළිතුරු ලැබූ සංඛ්‍යාව | 13 |
| පිළිතුරු අනුව පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කර ගැනීමට කටයුතු කිරීම නිසා එකඟතාවය ලබා දුන් ප්‍රමාණය | 08 |
| පිළිතුරු ලැබිය යුතු සංඛ්‍යාව | 06 |

# තවදුරටත් අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රයන්

i. ක්‍රීඩා සමිති ක්‍රියාත්මක මට්ටමේ පවත්වාගෙන යාම සහ එම සමිති වෙත ලබා දුන් ක්‍රීඩා භාණ්ඩ ලේඛනගත කිරීම සහ භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ ක්‍රමවේද සකස් කල යුතුය.

II. ක්‍රීඩා සංචිත ඇති කිරීම

සමස්ථ ලංකා සහ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩා තරඟ සඳහා ක්‍රීඩක ක්‍රීඩිකාවන් සහභාගී කර වීම සඳහා වැඩ පිළිවෙලක් මෙන්ම ක්‍රීඩක ක්‍රීඩිකාවන් තෝරා ගැනීමත් සහ ඔවුන්ගේ ක්‍රීඩාව සංවර්ධන කිරීමත් සංචිත ඇති කර ඒ මඟින් සුදුසු බව පෙන්වා දෙමි.

# 06. අමාත්‍යාංශ යටතට නොගැනෙන ආයතන

මෙම ආයතනය සඳහා විගණන පරීක්ෂණ 20 ක ප්‍රමාණයක් සිදු කරන ලද අතර සැලකිය යුතු අඩුපාඩු නිරීක්ෂණය නොවූ බැවින් සුළු අඩුපාඩු විගණන හා කළමනාකරණ කමිටුවේදී සාකච්ඡා කර නිවැරදි කර ගැනීමට කටයුතු කරන ලදී.

මෙම ආයතන වල මූල්‍ය පාලන කටයුතු වලදී ගණකාධිකාරි තනතුරක අවශ්‍යතාවය ඇතත් අදාළ තනතුර අනුමත නොවීම මත වර්ෂ අවසාන ගිණුම් ඉදිරිපත් කිරීම හා වෙනත් මූල්‍ය ප්‍රකාශන වල ප්‍රමාදයන් සහ යම් යම් අඩුපාඩුත් නිරීක්ෂණය වේ.

එම ආයතන කිහිපයක් පහත පරිදිය.

i. ආණ්ඩුකාරවර කාර්යාලය

ii. සභා ලේකම් කාර්යාලය

iii. රාජ්‍ය සේවා කොමිෂන් සභාව

iv. සැලසුම් දෙපාර්තමේන්තුව

# 07. විගණන හා කළමනාකරණ කමිටු කාර්යභාරය (AUDIT AND MANAGEMENT COMMITTEE)

රාජ්‍ය මුදල් චක්‍රලේඛ (PN/PE/P/7), කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක DMA/2009(1) පාදක කර ගනිමින් ඌව පළාතේ ලේකම් විසින් නිකුත් කරන ලැබූ **2010/12** හා **2012/04** දරණ අභ්‍යන්තර චක්‍රලේඛය අනුව මෙම කමිටු කාර්යභාරය පවත්වාගෙන යනු ලැබේ. ඉහත කාර්යභාරය ඌව පළාත් සභා පරිපාලනයට යටත් මෙන්ම ගිණුම් ඒකක වශයෙන් ක්‍රියාත්මක වන ආයතන වල විගණන කමිටු පිහිටුවා ක්‍රියාත්මක මට්ටමින් පවත්වාගෙන යයි. ඒ අනුව විස්තර පහත පරිදි වේ.

# මේ වන විට පහත ආයතනයන්හි විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ඇත.

1. අමාත්‍යංශ

- ක්‍රීඩා
- කෘෂිකර්ම
- මාර්ග
- මුදල් (අධ්‍යාපන)
- සෞඛ්‍ය

## 02. කාර්යාල

- ආණ්ඩුකාරවර කාර්යාලය
- නියොජ්‍ය ප්‍රධාන ලේකම්(ඉංජිනේරු)
- නියොජ්‍ය ප්‍රධාන ලේකම්(මුල්‍ය)
- නියොජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන)
- නියොජ්‍ය ප්‍රධාන ලේකම්(පිරිස් හා පුහුණු)
- නියොජ්‍ය ප්‍රධාන ලේකම්(සැලසුම්)
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව
- සභා ලේකම් කාර්යාලය
- සෞඛ්‍ය සේවා  අධ්‍යක්ෂ(පලාත්)
- රාජ්‍ය සේවා කොමිෂන් සභාව
- සමුපාකාර සේවක කොමිෂන් සභාව
- ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ- මොණරාගල
- ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ- බදුල්ල
- පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ  කාර්යාලය(කහගොල්ල)
- යාන්ත්‍රික අධ්‍යක්ෂ  කාර්යාලය
- නියෝජ්‍ය පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ - මොණරාගල

## 03. දෙපාර්තමේන්තු

- අධ්‍යාපන දෙපාර්තමේන්තුව
- ආදායම් දෙපාර්තමේන්තුව
- ආයුර්වේද දෙපාර්තමේන්තුව
- ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
- ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
- ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව
- කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව
- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
- මාර්ග සංවර්ධන දෙපාර්තමේන්තුව
- ප්‍රතිපත්ති සහ ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුව
- පළාත් පාලන දෙපාර්තමේන්තුව
- පරිවාස හා ළමා ආරක්ෂක දෙපාර්තමේන්තුව
- සමුපාකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
- සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව
- සත්ව නිශ්පාදන දෙපාර්තමේන්තුව
- සමාජ සේවා දෙපාර්තමේන්තුව
- වාරි මාර්ග දෙපාර්තමේන්තුව
- අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව

## 04. මූලික රෝහල්

- දියතලාව
- මහියංගනය
- පස්සර
- වැලිමඩ
- වැල්ලවාය

# 05. කලාප අධ්‍යාපන කාර්යාල

- බදුල්ල
- බණ්ඩාරවෙල
- බිබිල
- මහියංගන
- පස්සර
- වැලිමඩ
- වැල්ලවාය
- මොණරාගල
- වියලුව

# 06. පළාත් පාලන ආයතන

- බදුල්ල මහ නගර සභාව
- බණ්ඩාරවෙල මහ නගර සභාව
- හපුතලේ නගර සභාව
- බදුල්ල
- බඩල්කුඹුර
- බණ්ඩාරවෙල
- බිබිල
- බුත්තල
- ඇල්ල
- හල්දුමුල්ල
- හාලිඇල
- හපුතලේ
- කන්දකැටිය
- කතරගම
- ලුණුගල
- මඩුල්ල
- මහියංගනය
- මැදගම
- මීගහකිවුල
- මොණරාගල
- පස්සර
- රිදීමාලියද්ද
- සියඹලාණ්ඩුව
- සොරණාතොට
- තණමල්විල
- ඌව පරණගම
- වැල්ලවාය
- වැලිමඩ

මේ අනුව ආයතන 80 ක විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ඇත. එම ආයතන වල 2016 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 162 ක ප්‍රමාණයක් පවත්වා ඇත. 2015 වර්ෂයේදී පැවැත් වූ විගණන හා කළමනාකරණ කමිටු සංඛ්‍යාව 46 කි. 2015 වර්ෂයට සාපේක්ෂව 2016 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්ද 116 කින් වැඩිකර ගැනීමට හැකිවිය. මෙහිදී පහත සඳහන් ක්ෂේත්‍රයන් පිළිබඳ අවධානය යොමු කරන ලදී.

- අභ්‍යන්තර විගණන සැලැස්ම හා අභ්‍යන්තර විගණන කටයුතු
- රාජ්‍ය විගණනය හා ගිණුම් කාරක සභා තීරණ ක්‍රියාත්මක කිරීම
- මූල්‍ය කළමනාකරණය හා ගිණුම් පවත්වාගෙන යාම
- සේවක මණ්ඩල කාර්ය සාධනය
- ආයතනයේ වත්කම් ආරක්ෂාව හා පාලනය
- ආයතනයේ ඉලක්ක හා අරමුණු කරා ගමන් කිරීම.

මෙහිදී රාජ්‍ය විගණනයේ සහභාගීත්වයද මෙම කමිටු සඳහා ලැබුණු බැවින් ආයතන වලට ගැටළු මෙන්ම පසුගිය විගණන වාර්තා මඟින් පෙන්වා දුන් අඩුපාඩු සැලකිය යුතු ප්‍රමාණයක් මඟ හරවා ගැනීමට හැකියාව ලැබුණි. මෙම තත්ත්වය මත 2015 වසරේ පවත්වා ගත් යහපත් විගණන මතය තවදුරටත් 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් ලබා ගැනීමටද හැකියාව ලැබෙනු ඇත.

2017 වර්ෂයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීමේදී කාර්ය සාධනය සහ කළමනාකරණ විගණනයක් (MANAGEMENT AUDIT) මෙන්ම මුදලට අගය (VALUE FOR MONEY) විගණන කටයුත්තක්ද සිදු කරමින් ගුණාත්මක සහ ඵලදායී අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට පහත නිර්ණායක පදනම් කර ගනිමින් බලාපොරොත්තු වෙමි.

I. නව විගණන ප්‍රමිත අනුසාරයෙන් විගණන කටයුතු සිදු කිරීම.

II. රාජ්‍ය විගණනය මෙන් නිශ්චිත ආකෘතියක් විගණන වාර්තා ඉදිරිපත් කිරීම.

III. අන්තර් පළාත් සම්බන්ධීකරණ වැඩසටහන් මඟින් ලබා ගත් අත්දැකීම් විගණන කටයුතු සඳහා දායක කර ගැනීම.

IV. ආයතනයක් වර්ෂයේ මුල, වර්ෂයේ මැද, විගණනය කර වර්ෂය අවසානයේදී අවසාන විගණන වාර්තාවක් සෑම ආයතනයක් වෙනුවෙන්ම ප්‍රධාන ලේකම් වරයාට ඉදිරිපත් කිරීම.

# විගණන කටයුතු සිදු කිරීමේදී දෙපාර්තමේන්තුව මුහුණ දෙන ගැටලු

ඌව පළාත් සභා පරිපාලනයට යටත් ආයතන 1200 කට (පාසැල්ද සමඟ) ආසන්න ප්‍රමාණයක සහ විශේෂ විමර්ශන හා විශේෂ පරීක්ෂණ 400 කට ආසන්න සංඛ්‍යාවක් පිළිබඳව විගණන කටයුතු මෙහෙයවීමට සිදුවී තිබේ. මෙහිදී දැනට විගණන කටයුතු සඳහා දෙපාර්තමේන්තුව තුළ යොමු කර සිටින නිලධාරීන් (නවක නිලධාරීන් 06 දෙනාද සමඟ) 16 දෙනෙකු අතරින් නිලධාරීන් කිහිප දෙනෙකු ස්ථාන මාරු අපේක්ෂාවෙන් සිටී. මේ අනුව ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට එක් නිලධාරියෙකු වෙත ආයතන 90 කට අධික සංඛ්‍යාවක පරීක්ෂණ කටයුතු සිදු කිරීමට සිදුවනු ලැබේ. මෙම තත්ත්වය ප්‍රායෝගිකව දුෂ්කර කටයුත්තක් වන අතර විගණනය සිදු කරන කාල වකවානුවද සීමා කිරීමටද එම නිසා සිදුවනු ඇත. රජයේ විගණනය විසින් නිරන්තරයෙන්ම ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු නොවන බවට වාර්තා කරනු ලබන්නේ එම නිසාය. උදාහරණ වශයෙන් දකුණු පළාතේ සභාවේ ආයතන 1300 කට විගණන නිලධාරීන් 58 දෙනෙකු අනුයුක්ත කර ඇති බවත් අන්තර් පළාත් සම්බන්ධීකරණ වැඩසටහනේදී අනාවරණය විය. මේ නිසා වෘත්තිය මට්ටමේ පුහුණුව ලබා ගත හැකි විගණන නිලධාරීන්ගේ අවශ්‍යතාවය දෙපාර්තමේන්තුව වෙත පවතී.

එසේම මොණරාගල දිස්ත්‍රික්කයේ විගණන උප කාර්යාලයේ කටයුතු සක්‍රීය කර ගැනීමේ අවශ්‍යතාවයද මතුව ඇත. මේ සඳහා අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල සිටින පළාත් රාජ්‍ය සේවයේ වර්ෂ 05 කට වඩා වැඩි අත්දැකීම් තිබෙන සංවර්ධන නිලධාරී සේවයේ නිලධාරීන් 10 දෙනෙක් පමණ අවශ්‍ය වේ. මේ පිළිබඳවද ඌව පළාත් ගරු ආණ්ඩුකාරතුමන්ගේ සහ ප්‍රධාන ලේකම්තුමා ඇතුළු සියලුම ලේකම්වරුන්ගේ අවධානය යොමු කරන ලෙස ඉල්ලා සිටිමි.

එළඹෙන 2017 වර්ෂය තුළදී සාර්ථක අභ්‍යන්තර විගණන කටයුත්තක් මෙහෙයවීමට අවශ්‍ය සහය ලබා දෙන ලෙස ඉල්ලා සිටිමින් එළඹෙන 2017 වර්ෂය ඔබ සැමට සුභ නව වසරක් වේවායි ප්‍රාර්ථනා කරමින් කරුණු ඉදිරිපත් කිරීම අවසන් කරමි.

# ස්තූතියි.